ගරු කථානායකතුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

2026.11.16

ගරු කථානායකතුමනි,

<u>පාර්ලිමේන්තු වරප්‍රසාද කඩවීමක් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටීම</u>

ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් ස්වභාවික උරුමයක් ලෙස සැලකෙන කාවන්තිස්ස හස්තියා 2026 ඔක්තෝබර් 16 වන දින ඛේදජනක ලෙස මිය යාමේ සිදුවීම සම්බන්ධයෙන් සත්‍ය තොරතුරු අනාවරණය කර ගැනීම, අදාළ සියලු පාර්ශ්වයන් විසින් තම වගකීම් නිසි පරිදි ඉටු කර තිබේද යන්න විමර්ශනය කිරීම, අනාගතයේදී මෙවැනි ඛේදජනක සිදුවීම් වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම සහ අලි-මිනිස් ගැටුමට තිරසාර විසඳුම් සෙවීම ඇතුළු කරුණු අටක් පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා විශේෂ තේරීම් කාරක සභාවක් පත් කරන ලෙස ඉල්ලා, මා ඇතුළු විපක්ෂයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අත්සන් කරන ලද යෝජනාවක් 2026 ඔක්තෝබර් 23 වන දින ගරු කථානායකතුමා වෙත විධිමත්ව භාර දෙන ලදී.

එම ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව අවස්ථා තුනකදී රැස්වී ඇතත්, අදාළ යෝජනාව සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු තීරණයක් ගෙන නොමැත. කෙසේ වෙතත්, ඊට පසුව ඉදිරිපත් කරන ලද වෙනත් යෝජනා සඳහා පවා ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. මෙවැනි තත්ත්වයක් තුළ, කාවන්තිස්ස හස්තියා ඇතුළු වනජීවී සම්පත සම්බන්ධයෙන් පවතින ජාතික වැදගත්කම සහ හදිසි අවශ්‍යතාව පිළිබඳව ආණ්ඩුව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති බවට සාධාරණ සැකයක් මතු වේ. එසේම, මෙම ජාතික වැදගත්කමකින් යුත් කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව තුළ විපක්ෂයට සිය දායකත්වය ලබා දීමට ඇති අවස්ථාව ද අහිමි වී තිබීම කණගාටුදායක තත්ත්වයකි.

ජාතික වැදගත්කමකින් යුත් කරුණු සම්බන්ධයෙන් නිසි ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කිරීම ආණ්ඩුව සතු වගකීමකි. ආණ්ඩුව විසින් සිය වගකීම් නිසි පරිදි ඉටු නොකරන අවස්ථාවකදී, ඒ පිළිබඳව අවධානය යොමු කරමින් වගවීම සහතික කිරීම විපක්ෂයේ ද ව්‍යවස්ථානුකූල හා පාර්ලිමේන්තුමය වගකීමකි. එවැනි පසුබිමක, විපක්ෂය ඉදිරිපත් කර ඇති නීත්‍යානුකූල යෝජනාවක් පිළිබඳව සාධාරණ කාලසීමාවක් තුළ සලකා බලා

තීරණයක් ගැනීමට අපොහොසත් වීම, හුදෙක් ප්‍රමාදයක් ලෙස පමණක් නොසැලකිය යුතුය.

මෙම ක්‍රියාකලාපය හේතුවෙන් පාර්ලිමේන්තුවේ විපක්ෂනායකවරයා ලෙස වශයෙන් මා වෙත පැවරී ඇති ව්‍යවස්ථානුකූල හා පාර්ලිමේන්තුමය වගකීම් ඉටු කිරීමටත්, පාර්ලිමේන්තු කටයුතු සඳහා අර්ථවත් හා ඵලදායී ලෙස සහභාගී වීමටත් ඇති අයිතියට අයුතු බාධාවක් සිදුවී ඇති බව මගේ අදහසයි.

ඒ අනුව, මෙම ක්‍රියාකලාපය පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ I කොටසේ 3 වන වගන්තිය මගින් සහතික කර ඇති පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් විය හැකි අතර, එම පනතේ උපලේඛනයේ අ කොටසේ 1 වන වගන්තිය සහ ආ කොටසේ 4 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති පාර්ලිමේන්තු කටයුතුවලට බාධා කිරීමක් ලෙස ද සලකා බැලිය යුතු බව මම අවධාරණය කරමි.

එබැවින්, ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, මෙම පැමිණිල්ල ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කර, අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

සජිත් ප්‍රේමදාස (පා.ම.)
විපක්ෂ නායක